# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/37 - 2018 අගෝස්තු මස 31 වැනි සිකුරාදා - 2018.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3 වන සහ 118 වන වගන්ති සමඟ කියවිය යුතු, එම පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**වෛද්‍ය රාජිත සේනාරත්න,**
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 දෙසැම්බර් මස 14 වන දින අංක 2049/31 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මඟින් සංශෝධිත, 2016 ඔක්තෝබර් මස 21 වන දින අංක 1989/61 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2016 අංක 2 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී (ඉහළ මිල සීමා) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි 3 වන නියෝගය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"3. උපලේඛනගත ඖෂධ සම්බන්ධයෙන් වන උපරිම සිල්ලර මිල (MRP) සීමා උපලේඛනගත ඖෂධවල සියලු වෙළඳ නාමයන් (brand names), ඖෂධ නාමයන් (generic names), මාත්‍රා ස්වරූපයන් (dosage forms) සහ ප්‍රබලතාවයන් (strengths) සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.".

(2) එහි 5 වන නියෝගයට ඉක්බිතිවම පහත දැක්වෙන නියෝගය ආදේශ කරනු ලබන අතර, එය එහි 5අ නියෝගය ලෙස බලාත්මක විය යුතු ය:-

1A - PG 4189 — 807 (2018/08)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

"5අ. මෙම නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට හා ඉන්පසුව මෙහි උපලේඛනයේ II වන කොටසේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් උපලේඛනගත ඖෂධයක් විකිණීමේ කාර්යය සඳහා සිය සන්තකයේ තබා ගෙන සිටින යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයක්, ඔසුසලක් හෝ යම් තැනැත්තෙකු ඇතුළු නිෂ්පාදකයෙකු, ආනයනකරුවෙකු, වෙළෙන්දෙකු, බෙදාහරින්නෙකු, ඖෂධවේදීයෙකු, වෛද්‍ය ආයතනයක් විසින් එවැනි කිසිදු ඖෂධයක් ඉහත කී උපලේඛනයේ V වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට (MRP) වඩා වැඩි මිලකට අලෙවි කිරීම නොකළ යුතු ය.".

(3) එහි 5 වන නියෝගයට ඉක්බිතිව ම පහත නියෝගය ඇතුළත් කිරීමෙන්:-

"5ආ. යම් උපලේඛනගත ඖෂධයක මාත්‍රා ස්වරූපය හෝ ප්‍රබලතාවය එකී උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, එසේ නිශ්චිතව දක්වා නොමැති එම මාත්‍රාවේ හෝ ප්‍රබලතාවයේ හෝ උපරිම සිල්ලර මිල ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) එහි 10 වන නියෝගයට ඉක්බිතිව ම පහත නියෝගය ඇතුළත් කිරීමෙන්:-

"11. මෙම නියෝගවල කාර්යය සඳහා-

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ ඊට ඇති අර්ථයම තිබිය යුතු ය.

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

(5) උපලේඛනය යන මාතෘකාවට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කිරීමෙන්:-

"I වන කොටස"

(6) උපලේඛනයේ I වන කොටසට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"II වන කොටස"

## උපලේඛනය

## II වන කොටස

### තෝරාගත් ඖෂධ නිෂ්පාදන දහතුනක උපරිම සිල්ලර මිල

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* | *IV තීරුව* | *V තීරුව* |
|---|---|---|---|---|
| | ඖෂධීය නාමය **(Generic name)** | ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය **(Dosage form)** | ප්‍රබලතාවය **(Strength)** | උපරිම සිල්ලර මිල (ශ්‍රී ලංකා රුපියල්) |
| 1 | සෙෆ්ටසිඩීම් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම් | 480.00 |
| | සෙෆ්ටසිඩීම් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 800.00 |
| | | | | |
| 2 | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 250 මි.ග්‍රෑම් | 240.00 |
| | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම් | 450.00 |
| | සෙෆ්ට්‍රිඇක්සෝන් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 700.00 |

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* | *IV තීරුව* | *V තීරුව* |
|---|---|---|---|---|
| | ඖෂධීය නාමය **(Generic name)** | ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය **(Dosage form)** | ප්‍රබලතාවය **(Strength)** | උපරිම සිල්ලර මිල (ශ්‍රී ලංකා රුපියල්) |
| 3 | සෙෆොටැක්සීම් | නික්ෂේපන | 500 මි. ග්‍රෑම් | 225.00 |
| | සෙෆොටැක්සීම් | නික්ෂේපන | 1 ග්‍රෑම් | 375.00 |
| | | | | |
| 4 | ෆ්ලුකොනසෝල් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 25.00 |
| | ෆ්ලුකොනසෝල් | පෙති/කරල් | 150 මි.ග්‍රෑම් | 45.00 |
| | | | | |
| 5 | ඉන්සියුලින් සොලියුබල් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1මි.ලී. (10 මි.ලී.කුප්පිය) | 1200.00 |
| | ඉන්සියුලින් සොලියුබල් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (3 මි.ලී. කාට්‍රිජය) | 600.00 |
| | ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (10 මි.ලී. කුප්පිය) | 1200.00 |
| | ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී (3 මි.ලී. කාට්‍රිජය) | 600.00 |
| | බයිෆෙසික් අයිසෝෆෙන් ඉන්සියුලින්(ඉන්සියුලින් සොලියුබල් හියුමන් 30 අයි.යු/ 1 මි.ලී., ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් 70 අයි.යු/ 1 මි.ලී. මිශ්‍රණය ලෙස) | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී. (10 මි.ලී. කුප්පිය) | 1200.00 |
| | බයිෆෙසික් අයිසෝෆෙන් ඉන්සියුලින්(ඉන්සියුලින් සොලියුබල් හියුමන් 30 අයි.යු/ 1 මි.ලී.) ඉන්සියුලින් අයිසොෆෙන් හියුමන් 70 අයි.යු/ 1 මි.ලී. මිශ්‍රණය ලෙස) | නික්ෂේපන | 100 අයි.යු/1 මි.ලී (3 මි.ලී. කාට්‍රිජය) | 600.00 |
| | | | | |
| 6 | ග්ලිම්පිරයිඩ් | පෙති | 1 මි.ග්‍රෑම් | 7.15 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 2 මි.ග්‍රෑම් | 10.15 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 3 මි.ග්‍රෑම් | 17.00 |
| | ග්ලිම්පිරයිඩ් | පෙති | 4 මි.ග්‍රෑම් | 18.50 |
| | | | | |
| 7 | සිටාග්ලිප්ටීන් | පෙති | 25 මි.ග්‍රෑම් | 15.00 |
| | සිටාග්ලිප්ටීන් | පෙති | 50 මි.ග්‍රෑම් | 28.50 |
| | සිටාග්ලිප්ටීන් | පෙති | 100 මි.ග්‍රෑම් | 48.50 |
| | | | | |
| 8 | ටැම්සුලොසීන් | පෙති/කරල් | 0.40 මි.ග්‍රෑම් | 21.00 |
| | | | | |
| 9 | මොන්ටිලුකාස්ට් | පෙති | 4 මි.ග්‍රෑම් | 12.00 |
| | මොන්ටිලුකාස්ට් | පෙති | 5 මි.ග්‍රෑම් | 15.00 |
| | මොන්ටිලුකාස්ට් | පෙති | 10 මි.ග්‍රෑම් | 21.00 |
| | | | | |

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* | *IV තීරුව* | *V තීරුව* |
|---|---|---|---|---|
| | ඖෂධීය නාමය **(Generic name)** | ලබා ගනු ලබන ක්‍රමය/මාත්‍රා ආකාරය **(Dosage form)** | ප්‍රබලතාවය **(Strength)** | උපරිම සිල්ලර මිල (ශ්‍රී ලංකා රුපියල්) |
| 10 | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 12.25 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 75 මි.ග්‍රෑම් | 15.50 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 100 මි.ග්‍රෑම් | 19.25 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 150 මි.ග්‍රෑම් | 24.00 |
| | ප්‍රෙගබලීන් | පෙති/කරල් | 300 මි.ග්‍රෑම් | 39.50 |
| | | | | |
| 11 | ටොපිරමේට් | පෙති/කරල් | 25 මි.ග්‍රෑම් | 20.00 |
| | ටොපිරමේට් | පෙති/කරල් | 50 මි.ග්‍රෑම් | 32.00 |
| | ටොපිරමේට් | පෙති/කරල් | 100 මි.ග්‍රෑම් | 52.00 |
| | | | | |
| 12 | ලැමෝට්‍රිජීන් | පෙති | 25 මි.ග්‍රෑම් | 12.00 |
| | ලැමෝට්‍රිජීන් | පෙති | 50 මි.ග්‍රෑම් | 21.00 |
| | ලැමෝට්‍රිජීන් | පෙති | 100 මි.ග්‍රෑම් | 35.00 |
| | | | | |
| 13 | ඇටෝවාස්ටැටින් | පෙති | 5 මි.ග්‍රෑම් | 6.75 |
| | ඇටෝවාස්ටැටින් | පෙති | 40 මි.ග්‍රෑම් | 26.00 |

09 - 322/01

---

එල්.ඩී.බී. 9/2016

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3 වන සහ 118 වන වගන්ති සමග කියවිය යුතු, එම පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2018 අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

## නියෝග

1. මෙම නියෝග 2018 ඖෂධ (ටෙන්ඩර් මිල නියම කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඖෂධ (මෙහි මින්මතු "උපලේඛනගත ඖෂධ" යනුවෙන් සඳහන් කරනු ලබන) සඳහා වන උපරිම ටෙන්ඩර් මිල (මෙහි මින්මතු "උපරිම ටෙන්ඩර මිල (MTP)" යනුවෙන් සඳහන් කරනු ලබන) සඳහා උපරිම මිල සීමාවක් පැවතිය යුත්තේ ය.

3. උපලේඛනගත ඖෂධ සම්බන්ධයෙන් වන උපරිම ටෙන්ඩර් මිල (MTP) සීමා උපලේඛනගත ඖෂධවල සියලු වෙළඳ නාමයන් (Brand names), ඖෂධ නාමයන් (Generic names), මාත්‍රා ස්වරූපයන් (Dosage forms) සහ ප්‍රබලතාවයන් (Strengths) සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

4. මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට හා ඉන්පසුව මෙහි උපලේඛනයේ II වන තීරුවේ දක්වා ඇති යම් උපලේඛනගත ඖෂධයක් ප්‍රසම්පාදනය කිරීමේ දී හෝ හදිසි මිලදී ගැනීමක් සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවෙකු, වෙළෙන්දෙකු, බෙදාහරින්නෙකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් එකී කිසිඳු ඖෂධයක් සඳහා ඉහත කී උපලේඛනයේ V වන තීරුවේ දක්වා ඇති උපරිම ටෙන්ඩර් මිලට (MTP) වඩා වැඩි මිලකට ලංසු තැබීම හෝ මිල ගණන් ඉදිරිපත් කිරීම හෝ නොකළ යුතු ය.

5. මේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සිට, මෙහි උපලේඛනයේ II වන තීරුවේ දක්වා ඇති යම් උපලේඛනගත ඖෂධයක් වෙනුවෙන් යම් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍යය ආයතනයක් විසින් ටෙන්ඩරයක් පිළිගැනීමේ දී හෝ හදිසි මිල දී ගැනීමක් සිදු කිරීමේ දී එකී ඖෂධය සඳහා ඉහත කී උපලේඛනයේ V වන තීරුවේ දක්වා ඇති උපරිම ටෙන්ඩර් මිලට (MTP) වඩා වැඩි මිලකට ටෙන්ඩරය පිළිගැනීම හෝ හදිසි මිල දී ගැනීම සිදු නොකළ යුතු ය.

6. ප්‍රසම්පාදනය හෝ හදිසි මිල දී ගැනීමේ කාර්යය සඳහා යම් උපලේඛනගත ඖෂධයක මාත්‍රා ස්වරූපයන් හෝ ප්‍රබලතාවන් හෝ එකී උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, එකී මාත්‍රාවේ හෝ ප්‍රබලතාවයේ හෝ උපරිම ටෙන්ඩර් මිල ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු ය.

7. ඉහත නියෝගවල විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් උපලේඛනගත ඖෂධවල මාත්‍රා ස්වරූපයේ එක් ඒකකයක උපරිම ටෙන්ඩර් මිල එකී උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු වන අතර, ප්‍රතිශෝධනය කරනු ලබන තෙක් එකී උපරිම ටෙන්ඩර් මිල මේ නියෝග ක්‍රියාත්මක වන දින සිට හා ඉන්පසුව බලාත්මකව පැවතිය යුතු ය.

8. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තෙකු හෝ ආයතනයක් විසින් 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, එකී පනතේ IV වන කොටස යටතේ එම තැනැත්තාට හෝ ආයතනයට එරෙහිව නඩු පවරනු ලැබිය යුතු ය.

## උපලේඛනය

*තෝරාගත් ඖෂධ නිෂ්පාදන දහයක උපරිම ටෙන්ඩර් මිල*

| ***I*** ***තීරුව*** | ***II තීරුව*** | ***III තීරුව*** | ***IV තීරුව*** | ***V තීරුව*** |
|---|---|---|---|---|
| | ඖෂධීය නාමය **(Generic name)** | ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය **(Dosage form)** | ප්‍රබලතාවය **(Strength)** | උපරිම ටෙන්ඩර් මිල (ශ්‍රී ලංකා රුපියල්) |
| 1 | ට්‍රැස්ටුසුමැබ් | නික්ෂේපන | 150 මි.ග්‍රෑම් | 32,390.00 |
| | ට්‍රැස්ටුසුමැබ් | නික්ෂේපන | 440 මි.ග්‍රෑම් | 95,000.00 |
| | | | | |
| 2 | බෙවැසිසුමැබ් | නික්ෂේපන | 100 මි.ග්‍රෑම්/4 මි.ලි. | 35,000.00 |

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* | *IV තීරුව* | *V තීරුව* |
|---|---|---|---|---|
| | ඖෂධීය නාමය **(Generic name)** | ලබා ගනු ලබන ක්‍රමය/ මාත්‍රා ආකාරය **(Dosage form)** | ප්‍රබලතාවය **(Strength)** | උපරිම ටෙන්ඩර් මිල (ශ්‍රී ලංකා රුපියල්) |
| 3 | රිටුක්සිමැබ් | නික්ෂේපන | 100 මි.ග්‍රෑම්/10 මි.ලී. | 11,000.00 |
| | රිටුක්සිමැබ් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම්/50 මි.ලී. | 55,000.00 |
| | | | | |
| 4 | මයිකොෆීනොලේට් මොෆෙටිල් | පෙති/කරල් | 500 මි.ග්‍රෑම් | 15.00 |
| | | | | |
| 5 | පෙග් ඇස්පරජිනේස් (පෙග් ඇස්පාජේස්) | නික්ෂේපන | 3750 අයි.යු. | 140,000.00 |
| | | | | |
| 6 | පෙමිට්‍රෙක්ස්ඩ් ඩයිසෝඩියම් | නික්ෂේපන | 100 මි.ග්‍රෑම් | 3,120.00 |
| | පෙමිට්‍රෙක්ස්ඩ් ඩයිසෝඩියම් | නික්ෂේපන | 500 මි.ග්‍රෑම් | 15,600.00 |
| | | | | |
| 7 | බෝට්සෝමිබ් | නික්ෂේපන | 2 මි.ග්‍රෑම් | 14,500.00 |
| | | | | |
| 8 | පෙග් ඉන්ටෆෙරෝන් ඇල්ෆා 2 ඒ | නික්ෂේපන | 180 මයික්‍රො.ග්‍රෑම් | 27,700.00 |
| | | | | |
| 9 | ඇබිරටෙරෝන් ඇසිටේට් | පෙති | 250 මි.ග්‍රෑම් | 275.00 |
| | | | | |
| 10 | පෙග් ෆිල්ග්‍රැස්ටිම් | නික්ෂේපන | 6 මි.ග්‍රෑම්/0.6 මි.ලී., 6 මි.ග්‍රෑම්/1 මි.ලී. | 22,000.00 |

09 - 322/02

එල්.ඩී.බී. 9/2016

## 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 3 වන සහ 118 වන වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2018 ක් වූ අගෝස්තු මස 29 වැනි දින,
කොළඹ දී ය.

### නියෝග

1. මෙම නියෝග 2018 වෛද්‍ය උපකරණ (මිල නියම කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කිසිදු නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකු විසින් යම් වෙළඳ නාමයකින් (Brand Name), අනුමත නාමයකින් (Approved Name), මාදිළියකින් (Models), ප්‍රමාණයකින්(Sizes), හෝ ඇසුරුම් ප්‍රමාණයකින් (Pack Sizes) විස්තර වන මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් එහි දක්වා ඇති උපරිම සිල්ලර මිලට (MRP) වඩා වැඩි මිලකට අලෙවි කිරීම, අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ඒ සඳහා අය කිරීම නොකළ යුතු ය.

3. නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකු විසින් මෙහි උපලේඛනයේ දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් දැනට එහි දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩු යම් මිලකට විකුණනු ලබන විට ඔහු විසින් එහි මිල වැඩිකිරීමෙන් තොරව එහි පවත්නා මිල අඛන්ඩව පවත්වාගෙන යා යුතු ය.

4. වෙළඳ නාමයෙන්, අනුමත නාමයෙන්, මාදිළියෙන්, ප්‍රමාණයෙන් හෝ ඇසුරුම් ප්‍රමාණයෙන් මෙහි උපලේඛනයේ විස්තර කර ඇති යම් වෛද්‍ය උපකරණයක් අලෙවි කරන හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන හෝ ඒ සඳහා අය කරන සෑම තැනැත්තකුම හෝ 2 වන නියෝගයේ දක්වා ඇති ආයතනයක් එම වෛද්‍ය උපකරණය වෙනම අයිතමයක් ලෙස දක්වමින් වෛද්‍ය උපකරණයේ වෙළඳ නාමය හෝ අනුමත නාමය, ඇසුරුම් ප්‍රමාණය සහ මිල පැහැදිලිව දක්වන රිසිට් පතක් නිකුත් කළ යුතු ය.

5. නිෂ්පාදිත හෝ විකිණීමට තිබෙන වෛද්‍ය උපකරණ තොගයේ අයිතමවල එක් එක් ඒකකයේ මෙහි උපලේඛනයේ දක්වා ඇති අදාළ උපරිම සිල්ලර මිල ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් එසේ වුව ද, මෙම නියෝග පළ කරන ලද දිනයේ සිට දින හතළිස් පහක කාලසීමාවක් ඉකුත් වීමට පෙර අදාළ වෙළඳ ඇසුරුමේ හෝ ලේබලයේ මුද්‍රණය හෝ සළකුණු කළ යුතු ය.

6. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් හෝ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ IV වන කොටස යටතේ ඔහුට එරෙහිව නඩු විභාග කරනු ලැබිය යුතු ය.

7. මෙහි උපලේඛනයේ දක්වා ඇති වෛද්‍ය උපකරණවල උපරිම සිල්ලර මිල සෑම සිල්ලර අලෙවිසලකම ප්‍රදර්ශනය කිරීම සෑම නිෂ්පාදකයකු, ආනයනකරුවකු, බෙදාහරින්නකු, වෙළෙන්දෙකු, සැපයුම්කරුවකු, ඖෂධවේදියකු, වෛද්‍ය වෘත්තිකයකු, පෞද්ගලික වෛද්‍ය ආයතනයක් ඇතුළු යම් වෛද්‍ය ආයතනයක් සහ යම් වෛද්‍ය උපකරණ සන්තකයේ දරන්නකුගේ වගකීම විය යුතු ය.

8. එම වෛද්‍ය උපකරණවල වෙළඳ නාමය, මාදිළිය, ප්‍රමාණය හෝ ඇසුරුම් ප්‍රමාණයේ උපරිම සිල්ලර මිල උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක, එම උපරිම සිල්ලර මිල ජාතික ඖෂධ නියාමන අධිකාරිය මගින් නියම කළ යුතු ය.

9. මේ නියෝගවල -

"වෛද්‍ය වෘත්තිකයා" යන්නට (105 වන අධිකාරය) වූ වෛද්‍ය ආඥා පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"පෞද්ගලික වෛද්‍ය ආයතනය" යන්නට 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**උපලේඛනය**

***තෝරාගත් වෛද්‍ය උපකරණ නිෂ්පාදන දෙකක උපරිම සිල්ලර මිල***

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| | වෙළඳ නාමය/ අනුමත නාමය **(Brand name /Approved name)** | උපරිම සිල්ලර මිල *(MRP)* (ශ්‍රී ලංකා රුපියල්) |
| 1 | රුධිර ග්ලූකෝස් මාපක | එක් ඒකකයක් 2,750.00 |
| 2 | රුධිර ග්ලූකෝස් මාපකවල භාවිතා කරන පරීක්ෂණ තීරු | එක් පරීක්ෂණ තීරුවක් 50.00 |

09 - 322/03

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.